# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2365/29 - 2024 ජනවාරි මස 03 වැනි බදාදා - 2024.01.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

### ගරු ජනාධිපතිතුමාණන් විසින් කරන ලද නියමය

1979 අංක 61 දරන අත්‍යාවශ්‍ය මහජන සේවා පනත

මුද්‍රාව

**රනිල් වික්‍රමසිංහ**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති, රනිල් වික්‍රමසිංහ වන මම, 1979 අංක 61 දරන අත්‍යාවශ්‍ය මහජන සේවා පනතේ 2 වගන්තිය ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල අනුව මෙම නිවේදනය මගින් පහත උපලේඛනයෙහි සඳහන් වන සේවාවන් සැපයීමෙහි නිරතවන ඕනෑම රාජ්‍ය සංස්ථාවකින් හෝ රජයේ දෙපාර්තමේන්තුවකින් හෝ පළාත් පාලන ආයතනයකින් හෝ සමුපකාර සමිතියකින් හෝ ඒවායෙහි ශාඛාවකින් සපයනු ලබන සේවාවන් සාමාන්‍ය ජනජීවිතය පවත්වාගෙන යාම සඳහා අත්‍යාවශ්‍ය වන බව සහ එකී සේවාවට අවහිරයක් හෝ බාධාවක් විය හැකි බව සැලකිල්ලට ගනිමින් ඕනෑම රාජ්‍ය සංස්ථාවකින් හෝ රජයේ දෙපාර්තමේන්තුවකින් හෝ පළාත් පාලන ආයතනයකින් හෝ සමුපකාර සමිතියකින් හෝ ඒවායෙහි ශාඛාවකින් සපයනු ලබන පහත උපලේඛනයේ සඳහන් සේවාවන් පූර්වෝක්ත වගන්තියෙහි කාර්යයන් සඳහා අත්‍යාවශ්‍ය සේවාවන් බවට මෙම නියමයෙන් ප්‍රකාශයට පත්කරමි.

වර්ෂ දෙදහස් විසිහතරක් වූ ජනවාරි මස 03 වැනි දින අත්සන් කරන ලදී.

ගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ඊ. එම්. එස්. බී. ඒකනායක,
ජනාධිපති ලේකම්.

### උපලේඛනය

1. විදුලිබල සැපයීම සම්බන්ධව සියලු සේවාවන්,
2. ඛනිජ තෙල් නිෂ්පාදන හා ඉන්ධන සැපයීම හෝ බෙදාහැරීම,
3. (235 වන අධිකාරය වූ) තීරු බදු ආඥාපනතේ කාර්ය සඳහා අර්ථකථනය කරනු ලැබූ පරිදි වූ යම් වරායක් ඇතුළත වූ යාත්‍රාවලින් ආහාර හෝ පාන ද්‍රව්‍ය හෝ රට අඟුරු, තෙල් හෝ ඉන්ධන හෝ බෑම, ගෙනයාම, ගොඩබෑම, ගබඩා කිරීම, බාරදීම හා ඉවත් කිරීම,
4. ගුවන් තොටුපළවල් සහ වරායවල් ඇතුළුව ගුවන් මගින් ගමනාගමන සේවා සඳහා පහසුකම සැලසීම සහ පවත්වා ගෙන යාම.

EOG 01 - 0036


1A - G 41187— 361 (2024/01) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*